# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2111/2 – 2019 පෙබරවාරි 18 වැනි සඳුදා – 2019.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 28 දරන ආඥාව**

*මගේ යොමු අංකය* : 4–3/15/2014/වීඊ/308.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:*
කේඕටී/එල්එන්ඩී/ඒසීකිව්වීඅයි/01/70.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ඔක්තෝබර් මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා. – ප්‍රාදේශීය ලේකම්, කොටපොල.

2. ඉඩමේ විස්තරය. – දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරවක් කෝරළේ සුළු කොට්ඨාසයේ මතුගොඩේ (අ.ග.පි. 169) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එම්ආර්/කේටීපී/2017/34 හා 2017.02.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

**1. කැබලි අක්ෂර 'බී' – දෙනියාය වත්ත හැන්ඩ්පර්ඩ් කොටස, (ක්ෂේත්‍ර අංක 8) – ප්‍රමාණය: හෙක්.1.5524**

උතුරට: සී/ස තලවකැලේ වතු සමාගම හිමිකම් කියන හැන්ඩ්පර්ඩ් හංසවිලා ගම්මානය; නැගෙනහිරට: සී/ස තලවකැලේ වතු සමාගම හිමිකම් කියන හැන්ඩ්පර්ඩ් හංසවිලා ගම්මානය, මාර්ගය (මා.සං.අ.) සහ සී/ස තලවකැලේ වතු සමාගම හිමිකම් කියන සිරි සදහම් විහාර භූමිය; දකුණට: මාර්ගය (මා.සං.අ.) සහ සී/ස තලවකැලේ වතු සමාගම හිමිකම් කියන සිරි සදහම් විහාර භූමිය; බටහිරට: සී/ස තලවකැලේ වතු සමාගම හිමිකම් කියන සිරි සදහම් විහාර භූමිය සහ කැබලි අක්ෂර ඒ.

03 - 231

1A – G29479– 41(2019/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 26 දරන ආඥාව**

*මගේ යොමු අංකය* : 4–3/16/2018/යූඩීඒ/275.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: කඩු/ඉඩම්/03/152/යූඩීඒ.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 පෙබරවාරි මස 06 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා. – ප්‍රාදේශීය ලේකම්, කඩුවෙල.

2. ඉඩමේ විස්තරය. – බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 489ඒ, බොරළුගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පොරේ (කඩුවෙල මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/කේඩීඩබ්ලිව්/2018/621 හා 2018.11.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ ' – සයිබරාදූයාය – ප්‍රමාණය: හෙක්.1.5426 ක් පමණ**

උතුරට: ඇළ, හිමිකම් කියන අය සොයාගත නොහැකි දවටගහකුඹුර සහ මාළඹේ - ගොඩගම පාර; නැගෙනහිරට: පාර; දකුණට: පාර, එන්. ප්‍රේමතිලක හිමිකම් කියන දවටගහකුඹුර සහ ඇළ; බටහිරට: ඇළ සහ පාර.

02. **කැබලි අක්ෂර 'බී' – සයිබරාදූයාය – ප්‍රමාණය: හෙක්. 1.6449 ක් පමණ**

උතුරට: බී. ජේ. කුරේ සහ තවත් අය හිමිකම් කියන දවටගහවත්ත මාළඹේ - ගොඩගම පාර; නැගෙනහිරට: නිසාකෝ (පුද්.) සමාගම හිමිකම් කියන දවටගහවත්ත, ඇළ සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි දවටගහකුඹුර; දකුණට: හිමිකම් කියන අය සොයාගත නොහැකි දවටගහකුඹුර සහ ඇළ; බටහිරට: ඇළ, පාර සහ බී. ජේ. කුරේ සහ තවත් අය හිමිකම් කියන දවටගහවත්ත.

03 - 232

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.